සැ. යු.- (i) 2015.10.16 දින පළවූ අංක 1937 දරන ගැසට් පත්‍රයේ IV(අ) කොටස පළනොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,938 - 2015 ඔක්තෝබර් මස 23 වැනි සිකුරාදා - 2015.10.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 1790 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1791 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් *භාරගැනීම ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 නොවැම්බර් මස 13 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 ඔක්තෝබර් මස 30 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය.''*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1787- B 80994—5,402 (2015/10)
B1-

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දුරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු — ඇබෑර්තු

### ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව

### නිවාස පාලක/නිවාස පාලික තනතුර සඳහා බඳවා ගැනීම (පුරප්පාඩු සංඛ්‍යාව 02කි)

ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිවාස පාලක/නිවාස පාලිකා තනතුරුවල පවතින පුරප්පාඩු සඳහා මෙහි පහත දක්වා ඇති සුදුසුකම් සපුරාලන ශ්‍රී ලාංකිකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම්* :-

1.1 අධ්‍යාපන සුදුසුකම් :

1.1.1 සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම.

1.1.2 අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් එක් විෂයකින් හෝ (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

1.2 *වෘත්තීය සුදුසුකම්* : ක්ෂේත්‍රයේ ලබා ඇති වෘත්තීය සුදුසුකම් විශේෂ සුදුසුකම් ලෙස සැලකේ.

1.3 *පළපුරුද්ද* : රජයේ හෝ ඊට අනුබද්ධ නේවාසිකාගාරයක /ආයතනයක සහකාර ශිෂ්‍ය නිවාස අධිකාරී/සහකාර නිවාස පාලක හෝ ඊට සමාන හෝ උසස් තනතුරක වසර 02කට නොඅඩු පලපුරුද්දක් තිබීම.

1.4 *කායික සුදුසුකම්* : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

1.5 අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.

02. *වැටුප් පරිමාණය* :- රු. 13120-10x145-11x170-10x240-10x320-රු. 22040 (MN-1-2006A)

03. පොදු කොන්දේසි :-

3.1 වයස් සීමාව : 2015.07.01 දිනට වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර අවුරුදු 30ට නොවැඩි විය යුතුයි.

3.2 *බඳවා ගන්නා ක්‍රමය* :-

3.2.1 මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන්ගෙන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 15/90 හි නියම කර ඇති අනෙකුත් සියළු කොන්දේසිවලට යටත්ව නියමාකාරයෙන් සංස්ථාපිත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුසු පුද්ගලයින් තෝරාගනු ලැබේ.

3.2.2. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි* :

මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

3.2.3 *සේවා කොන්දේසි* :

ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 10-12 දක්වා වගන්ති අදාළ වේ.

3.2.4 අයදුම්කරුවන් විසින් මෙම නිවේදනයේ අග දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2015.11.06 දින හෝ ඊට පෙර ලැබෙන පරිදි ''අධ්‍යක්ෂ ජනරාල්, ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව, අංක 09, පිළිප් ගුණවර්ධන මාවත, කොළඹ 07'' යන ලිපිනයට එවිය යුතු ය.

3.2.5 අයදුම්කරුවන් විසින් ඉල්ලුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහල කෙලවරේ ''නිවාස පාලක/නිවාස පාලික තනතුර - 2015'' ලෙස සඳහන් කළ යුතුය. ඉල්ලුම්පත් සෑම ආකාරයකින්ම සම්පූර්ණ විය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන අතර ඉල්ලුම් පත්‍රය හෝ ඒ හා සම්බන්ධ ලිපි හෝ තැපෑලේදී නැති වූ බවට කරන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා ඉල්ලුම්පත් නොඑවා ප්‍රමාද කිරීමෙන් විය හැකි අලාභයක් අයදුම්කරු විසින්ම විඳ දරා ගත යුතුයි. ඉල්ලුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

3.2.6 තමා දැනුවත්ව ඉදිරිපත් කරන ලද යම් කිසි තොරතුරක් අසත්‍ය බව පෙනී ගියහොත් හෝ අයදුම්කරු/අයදුම්කාරිය හිතාමතාම යම්කිසි වැදගත් කරුණක් යටපත් කර ඇති බව පෙනී ගියහොත් එසේ නැතහොත් නුසුදුසු බව සේවය කරන කාලය තුළ කවර අවස්ථාවකදී හෝ ඔප්පු වුවහොත් ඔහු/ඇය සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වනු ඇත.

කේ. ඩී. එස්. රුවන්චන්ද්‍ර,
අධ්‍යක්ෂ ජනරාල්,
ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව.

අංක 09, පිළිප් ගුණවර්ධන මාවත,
කොළඹ 07.
2015 ඔක්තෝබර් මස 05 වැනි දින.

### ආදර්ශ අයදුම්පත්‍රය

### *ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව*

*නිවාස පාලක/නිවාස පාලික තනතුර සඳහා අයදුම්පත්‍රය*

01. (i) මුල'කුරු සමග අගට යෙදෙන නම :————.
(ii) මුල'කුරුවලින් හැඳින්වෙන නම් :————.

02. (i) පෞද්ගලික ලිපිනය :————.
(ii) ස්ත්‍රී/පුරුෂ භාවය :————.

03. ජාතික හැඳුනුම්පත් අංකය :————.

04. උපන් දිනය : වර්ෂය :————. මාසය :————. දිනය :————.

05. 2015.07.01 දිනට වයස අවුරුදු :——. මාස :——. දින :——.

06. (i) අධ්‍යාපන සුදුසුකම් :————.
(ii) වෘත්තීය සුදුසුකම් :————.
(iii) අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද :————.
(සහතික පිටපත් අමුණන්න.)

07. දුරකථන අංකය : ස්ථාවර :————. ජංගම :————.

08. ඔබ උසාවිය ඉදිරියේ කිසියම් චෝදනාවකට වරදකරුවකු වී ඇත්ද? ඔව්/නැත

(ඔව් නම් විස්තර සපයන්න.) :————.

09. අයදුම්කරුගේ සහතිකය :

(i) මෙම අයදුම්පතේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කරමි.

(ii) මවිසින් කරනු ලැබූ මෙම ප්‍රකාශයන් අසත්‍ය බැව් ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට පෙර නුසුදුස්සකු වන බව හා පත්වීම ලැබීමෙන් පසු එසේ ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව මම දන සිටිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

10-776

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## තිරසර සංවර්ධනය සහ වනජීවී අමාත්‍යාංශය

### ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන කාණ්ඩ 02 සේවා ගණයේ ගාස්තු අය කිරීමේ සහකාර තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය.

01. ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ පහත සඳහන් උද්භිද උද්‍යාන වල පවතින ගාස්තු අය කිරීමේ සහකාර තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා විවෘත තරග විභාගයට සුදුසුකම් ලත් අපේක්ෂකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1.1. *පුරප්පාඩු පවතින සේවා ස්ථාන :*

| | | |
|---|---|---|
| (i) | ගම්පහ උද්භිද උද්‍යානය | - හෙනරත්ගොඩ, ගම්පහ |
| (ii) | හක්ගල උද්භිද උද්‍යානය | - හක්ගල,නුවරඑළිය |
| (iii) | වියළි කලාපීය උද්භිද උද්‍යානය | - මිරිජ්ජවිල, හම්බන්තොට |
| (iv) | තෙත් කලාපීය උද්භිද උද්‍යානය | - සීතාවක, අවිස්සාවේල්ල |
| (v) | පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය | - පේරාදෙණිය |

1.2. *තනතුරේ රාජකාරී ස්වභාවය :*

උද්භිද උද්‍යාන නැරඹීමට පැමිණෙන්නන් සඳහා උද්‍යානයට ඇතුල් වීමට අදාළ ගාස්තු නිවැරදිව අයකර ගැනීම හා ඒ වෙනුවෙන් නියමිත අවසර පත්‍ර නිකුත් කිරීම, අනෙකුත් ගාස්තු අයකර ගැනීම හා බිල්පත් නිකුත් කිරීම, අවසරපත්, බිල්පත්,මුදල් සම්බන්ධ ලේඛන නිසි ලෙස පවත්වාගෙන යෑම.

02. *සේවා කොන්දේසි :-*

තෝරා ගනු ලබන අපේක්ෂකයන් පහත සඳහන් කොන්දේසි වලට යටත්ව උක්ත සේවා ගණයේ III ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

(i) මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය.

(ii) පත්වීම ක්‍රියාත්මක වන දින සිට වසර 3 ක පරිවාස කාලයකට යටත්ය.

(iii) තෝරා ගනු ලබන නිලධාරීන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය, ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග, වෙනත් රජයේ චක්‍රලේඛ හා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පාටිපාටික රීති යටතේ දැනට පවත්නා හා ඉදිරියේ දී වන සංශෝධන ඇතුළත් නීති රීති, ව්‍යවස්ථා සහා විධිවිධාන වලට යටත්ව කටයුතු කළ යුතුය.

(iv) III ශ්‍රේණිය සඳහා පත් කරන ලද දින සිට 4 වන වැටුප් පියවරට එළඹීමට පෙර I වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්විය යුතුය.

(v) එසේම 2007.05.28 දිනැති රා.ප.ච. 07/2007 පරිදි දෙවැනි රාජ්‍ය භාෂාව පිළිබඳ නියමිත ප්‍රවීනතාව ලබා ගත යුතුය.

03. *වැටුප් කාණ්ඩ හා පරිමාණය :-*

රා.ප.ච. 6/2006 IV අනුව,
වැටුප් කාණ්ඩය - MN -01-2006A
වැටුප් පරිමාණය - (මාසික) - රු. 13,120 - 10 x 145 - 11 x 170 - 10 x 240 - 10 x 320 - රු. 22040
(මීට අමතරව, රජයේ අනුමත දීමනා ගෙවනු ලැබේ.)

04. *සුදුසුකම් :-*

4.1. *අධ්‍යාපන සුදුසුකම් :*

(I) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් 2 කට සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරක දී විෂයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම.

සහ

II. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් ප්‍රධාන විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත් වී තිබීම.

4.2. වයස් සීමාව :
අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, වයස අවුරුදු 30 ට නොවැඩි විය යුතුයි.

4.3. වෙනත් :

I. සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටුකිරීමට ප්‍රමාණවත් මනා කායික හා මානසික සෞඛ්‍යයෙන් යුක්ත විය යුතු ය.

II. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම.

III. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

IV. තනතුරට බඳවා ගැනීමට අවශ්‍ය සුදුසුකම් අයදුම්පත්‍ර භාර ගන්නා අවසන් දිනවන විට සෑම අයුරකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

05. බඳවා ගැනීමේ ක්‍රමවේදය :

මූලික සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන් විවෘත තරග විභාගයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරාගනු ලැබේ. තරග විභාගයේ දී වැඩිම ලකුණු ලබාගෙන සමත්වන්නන් අතරින් පුරප්පාඩු පවතින ප්‍රමාණය මෙන් දෙගුණයක ප්‍රමාණයක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර, තරග විභාගය සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු මත කුසලතා අනුපිළිවෙළට පුරප්පාඩු අනුව බඳවාගනු ලැබේ.

5.1. ලිඛිත විභාගය - ලකුණු 100

සාමාන්‍ය දැනීම, බුද්ධි පරීක්ෂණය හා භාෂා හැකියාව මැන බලන ඒකාබද්ධ ප්‍රශ්න පත්‍රයකි.

සමත් ලකුණු - 40%

5.2. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය - ලකුණු 100

අතිරේක අධ්‍යාපන සුදුසුකම්, පරිගණක සාක්ෂරතාව, භාෂා කුසලතා සහ සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාව සඳහා ලකුණු ලබාදෙනු ලැබේ.

5.3. විභාගය පැවැත්වෙන දිනය හා ස්ථානය ඉදිරියේ දී දැනුම් දෙනු ලැබේ.

5.4. භාෂා මාධ්‍යය,
විවෘත තරග විභාගය සිංහල හා දෙමළ මාධ්‍යයන්ගෙන් පැවැත්වේ.

06. අයදුම් කරන පිළිවෙළ :

මෙම දැන්වීමේ සඳහන් ආකෘතියට අනුව A4 (81/2" x 12") ප්‍රමාණයේ කඩදාසියේ දෙපැත්තම භාවිතා කර අයදුම්පත් සකස් කර ගත යුතු ය.

6.1. විභාග ගාස්තුව :

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පෙර ඕනෑම ලංකා බැංකු ශාඛාවකින්, පේරාදෙණිය ලංකා බැංකුවේ ජාතික උද්භිද උද්‍යාන අධ්‍යක්ෂ ජනරාල්ගේ ගිණුම් අංක 0007040743 ට රු. 400/- ක මුදලක් ගෙවා අදාළ රිසිට්පත අයදුම්පතේ නියමිත කොටුවේ ඇලවිය යුතු ය. (රිසිට්පතේ ඡායා පිටපතක් තමා සතුව තබා ගැනීම වඩා යෝග්‍ය වේ.)

6.2. අයදුම්පත සමග පහත ලේඛනවල ඡායා පිටපත් අමුණා තිබිය යුතු ය. :-

I. විභාග ගාස්තුව ගෙවූ රිසිට්පත;
II. අපොස (සා/පෙළ) සහතිකය;
III. අපොස (උ/පෙළ) සහතිකය;
IV. උප්පැන්න සහතිකය.

6.3. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය : 2015 නොවැම්බර් 13

6.4. අයදුම්පත් එවිය යුතු ලිපිනය

සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2015.11.13 දින හෝ ඊට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් යොමු කළ යුතු අතර, ලිපි කවරයේ ඉහළ වම්පස කෙළවර ගාස්තු අය කිරීමේ සහකාර - විවෘත තරග විභාගය යන්න සටහන් කළ යුතු වේ.

*ලිපිනය :* අධ්‍යක්ෂ ජනරාල්,
ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 14,
පේරාදෙණිය.

6.5. නියමිත දින පසු වී ලැබෙන හා අවශ්‍ය මූලික සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත්‍ර මෙන්ම අසම්පූර්ණ හා මෙහි සඳහන් ඡායා පිටපත් නොඑවන ඉල්ලුම්පත්‍ර තරග විභාගයට පෙර ප්‍රතික්ෂේප කිරීමේ බලය අධ්‍යක්ෂ ජනරාල් සතුවේ.

ආචාර්ය ඩී.එච්.පී. පෙරමුණුගම,
අධ්‍යක්ෂ ජනරාල් - ජාතික උද්භිද උද්‍යාන.

**අයදුම් පත්‍රය**

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ කළමණාකාර සහකාර තාක්ෂණික නොවන කාණ්ඩ 02 සේවා ගණයේ ගාස්තු අය කිරීමේ සහකාර තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

01. විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය සිංහල - 01
දෙමළ - 02

02. (i) මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) Mr./Mrs./Miss. :————.

(ii) මුලකුරු සමග නම (සිංහලෙන්) :————. මහතා/ මහත්මිය/ මෙනවිය.

03. මුලකුරුවලින් දැක්වෙන නම් (සිංහලෙන්) :————.

04. ජාතික හැඳුනුම්පත් අංකය :————.

05. I. ස්ථිර ලිපිනය :————.

II. තැපැල් ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

06. I. උපන් දිනය :————.

II. 2015.10.30 දිනට වයස :

අවුරුදු ☐ මාස ☐ දින ☐

07. ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී 01 ☐
පුරුෂ 02

08. විවාහක අවිවාහක බව : විවාහක 01 ☐
අවිවාහක 02

09. ජන වර්ගය : ☐

සිංහල 01 , දෙමළ 02 , මුස්ලිම් 03 , වෙනත් 04

10. දුරකථන අංකය :————.

11. අධ්‍යාපන සුදුසුකම් :

I. අ.පො.ස. (සා/පෙළ) :

වර්ෂය :————. විභාග අංකය :————.

| *විෂය* | *සාමාර්ථය* | *විෂය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| 01. | | 06. | |
| 02. | | 07. | |
| 03. | | 08. | |
| 04. | | 09. | |
| 05. | | 10. | |

II. අ.පො.ස. (උ/පෙළ)

වර්ෂය :————. විභාග අංකය :————.

| *විෂය* | *සාමාර්ථය* |
|---|---|
| 01. | |
| 02. | |
| 03. | |
| 04. | |

12. දැනට කරන රැකියාව :————.

රැකියා ස්ථානයේ නම සහ ලිපිනය :————.

13. I. ඔබ යම් වරදකට අධිකරණයෙන් දඬුවම් ලබා ඇත් ද ?
ඔව් / නැත.

ඇත්නම් තොරතුරු දක්වන්න. :

......................................................................
......................................................................
......................................................................

II. රජයේ සේවයේ තනතුරකින් පහ කරන ලද හෝ සේවය හැර ගියා සේ සලකා ඇති පුද්ගලයෙක් ද යන්න : ඔව් / නැත.

14. විභාග ගාස්තු ගෙවූ රිසිට්පත පිළිබඳ තොරතුරු
අංකය :————.
දිනය :————.
බැංකුව :————.

| රිසිට්පත නිසි පරිදි අලවන්න |
|---|

15. අයදුම්කරුගේ ප්‍රකාශය :

මෙම අයදුම්පතෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හැටියට සත්‍ය හා නිවැරදි බව ද, අදාළ ඡායාපිටපත් අමුණා ඇති බව ද, විභාගයට අදාළ නීතිරීතිවලට එකඟ වන බව ද, මා විසින් සපයා ඇති තොරතුරු සාවද්‍ය වීමෙන් මා විභාගයට පෙනී සිටීමට හෝ තනතුරු සඳහා බඳවා ගැනීමට නුසුදුස්සෙකු වන ඕනෑම අවස්ථාවක දී මගේ අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමට හෝ අපේක්ෂකත්වය අවලංගු කිරීමට එකඟ වන බව ද, පත්වීම් සම්බන්ධ අවසන් තීරණය උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සතු වන බවත් පිළිගනිමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

16. රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන් සඳහා පමණි.

*දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :*

මෙම ඉල්ලුම්කරු වන .................................... මයා/ මිය/ මෙනවිය දැනට මෙම ආයතනයේ .................................... වශයෙන් ස්ථිර / තාවකාලික සේවයේ යෙදෙන බවත්, ඔහුගේ වැඩ/ පැමිණීම/හැසිරීම සතුටුදායක / අසතුටුදායක බවත්, සඳහන් කරමි. ඉල්ලා ඇති තනතුර සඳහා ඔහු / ඇය තෝරා ගනු ලැබුවහොත්, මෙම ආයතනයේ දැනට දරන තනතුරින් නිදහස් කිරීමට හැකියාව ඇත / නැත.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන

නිල මුද්‍රාව

දිනය :————.

10-834

## ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව

### ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික සේවා ගණයෙහි පුරප්පාඩු තනතුරුවලට බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම (විවෘත) - 2015

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ උක්ත සේවා ගණයේ පහත පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා මෙම නිවේදනයේ දක්වා ඇති අවශ්‍ය සුදුසුකම් සපුරාලන ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *පුරප්පාඩු පවතින තනතුරු :*

(i) අධීක්ෂණ නිලධාරි
(ii) තාක්ෂණ නිලධාරි
(iii) සැලසුම් ශිල්පී
(iv) නාවික ඉංජිනේරු සහකාර

02. *සේවා කොන්දේසි :*

රජයේ සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 අනුව සකසා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලැබී ඇති (MN-3II-2006A) බඳවා ගැනීම් පරිපාටියේ සඳහන් කොන්දේසිවලට ද යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයින් අදාළ තනතුරේ III ශ්‍රේණියට පත් කරනු ලැබේ.

පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම් ක්‍රියාත්මක වන දිනය ධීවර හා ජලජ සම්පත් අධ්‍යක්ෂ ජනරාල් විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් ඇබෑර්තු සංඛ්‍යාවක් හෝ ඇබෑර්තු සියල්ලම හෝ නොපිරවීමට අධ්‍යක්ෂ ජනරාල්වරයාට බලය ඇත.

මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය.

03. *වැටුප් කාණ්ඩය සහ පරිමාණය :*

වැටුප් කේත අංකය : MN-3-2006-A
වැටුප් පරිමාණය : රු. 15,005-4x180 - 6x240 - 11x320 - 20x360 - රු. 27,885

04. *අධ්‍යාපන සුදුසුකම් :*

ශුද්ධ ගණිතය/ව්‍යවහාරික ගණිතය/සංයුක්ත ගණිතය හා භෞතික විද්‍යාව /ඉංජිනේරු තාක්ෂණවේදය/ තාක්ෂණවේදය/තාක්ෂණවේදය සඳහා විද්‍යාව යන විෂයන් අතරින් දෙකක් (02) සහිතව විෂයන් තුනකින් (03) අ. පො. ස. (උ/පෙළ) විභාගය එකවර සමත්වීම;සහ

සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

05. *වෘත්තීය සුදුසුකම් :*

(i) මොරටුව විශ්ව විද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික ඩිප්ලෝමාව,

හෝ

(ii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ඩිප්ලෝමාව,

හෝ

(iii) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව,

හෝ

(iv) ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව,

හෝ

(v) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ 1 වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම,

හෝ

(vi) රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තිය කුසලතා (NVQ) 6 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම,

හෝ

(vii) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබාගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම් වලට සියලු අතින් සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

06. *පළපුරුද්ද :* අදාළ නොවේ.

07. *කායික සුදුසුකම් :*

මෙම තනතුරට පත්වන තැනැත්තන් ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සුදුසු මනා ශාරීරික හා මානසික සෞඛ්‍යයෙන් යුක්ත විය යුතු ය.

08. *වෙනත් සුදුසුකම් :*

(i) සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.

(ii) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

(iii) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය වන සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන අවසන් දිනට ප්‍රථම සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

09. *වයස් සීමාව :*

ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනය වන විට වයස අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 30ට නොවැඩි විය යුතු ය.

10. *බඳවා ගැනීමේ ක්‍රමය :*

ලිඛිත විභාගයක හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගයේ එක් එක් විෂයය වෙනුවෙන් 40% ට වැඩි ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතාවයේ

අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරා ගනු ලැබේ.

(අ) බඳවා ගැනීමේ තරග විභාගය, සිංහල හා දෙමළ භාෂා දෙකෙන් පමණක් පවත්වනු ඇත.

(ආ) බඳවා ගැනීමේ තරග විභාගයට ඉල්ලුම්කරුවෙකු තමන් ඉල්ලූ භාෂා මාධ්‍යයෙන් සියලුම ප්‍රශ්න පත්‍රවලට පිළිතුරු ලිවිය යුතු අතර, ඉල්ලුම්පත්‍රයෙහි සඳහන් භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අපේක්ෂකයකුට අවසර නොලැබේ.

11. *ලිඛිත තරග විභාගය :*

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය හා අභියෝග්‍යතාව | පැය 01 | 100 | 40% |
| 2. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | පැය 02 | 100 | 40% |

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය හා අභියෝග්‍යතාව | * සංඛ්‍යාමය හැකියාව, ගැටළු නිරාකරණය, තර්කන ශක්තිය හා සාමාන්‍ය බුද්ධිය යන මාතෘකා යටතේ සකස් කරන ලද විෂයානුබද්ධ කෙටි ප්‍රශ්න පත්‍රයකි. |
| 2. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | *I වන කොටස* පරිසරය, විද්‍යාත්මක සොයා ගැනීම්, විද්‍යා දැනුම, ජාත්‍යන්තර තොරතුරු පිළිබඳ ප්‍රශ්න වලින් යුක්තය. *II කොටස* විෂයානුබද්ධ ප්‍රශ්නවලින් යුක්තය. |

12. *විභාග ගාස්තු :*

විභාග ගාස්තුව රු. 500 ක් වන අතර, මෙම ගාස්තුව විභාග ඉල්ලුම් පත් භාර ගන්නා අවසාන දිනට පළමුව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ නමින් ලංකා බැංකුවේ ටොරින්ටන් ශාඛාවේ ගිණුම් අංක 2323278 දරන ගිණුමට බැරවන ලෙස ගෙවිය යුතුය. ලබා ගන්නා ලදු පත ඉල්ලුම් පත්‍රයේ අදාළ කොටුවෙහි ඇලවිය යුතුය. ලදු පතෙහි ඡායා පිටපතක් අයදුම්කරුවන් විසින් තමන් ළඟ තබා ගැනීම යෝග්‍ය වේ. මෙම විභාග ගාස්තු කිසිම හේතුවක් මත ආපසු ගෙවනු නොලැබේ.

13. *ඉල්ලුම් කිරීමේ ක්‍රමය :*

අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසිවල මෙම නිවේදනයේ අග දක්වා ඇති අකෘතිය අනුව සකස් කර ගත යුතුය. එම ආකෘතියේ 01 සිට 02 තෙක් ශීර්ෂ පළමුවන පිටුවට ද, 03 සිට 4.3 තෙක් දෙවන පිටුවට ද ඉතිරිය තුන්වන පිටුවට ද, වන ලෙස තම අයදුම්පත්‍රය පිටු 03කින් යුක්ත විය යුතු ය.

දැනට රජයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් එවනු ලබන අයදුම්පත්, අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට කලින් පහත පළමු ඡේදයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ස්වකීය දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියා මාර්ගයෙන් එවිය යුතුය. ධීවර හා ජලජ සම්පත් අධ්‍යක්ෂ ජනරාල්ගේ පෞද්ගලික නමට හෝ වෙනත් නිලධාරියෙකුගේ පෞද්ගලික නමට හෝ අයදුම්පත් නොඑවිය යුතුය.

මෙම නිවේදනයේ අවසානයේ දැක්වෙන ආදර්ශ ආකෘතියට අනුව සකස් කළ අයදුම්පත් 2015 නොවැම්බර් මස 06 වැනි දිනට හෝ එදිනට පෙර "අධ්‍යක්ෂ ජනරාල්, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව, නව මහ ලේකම් කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ 10." යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත්‍ර බහාලූ කවරයේ වම් පස ඉහළ කෙළවරේ "ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර III ශ්‍රේණිය - තාක්ෂණික සේවා ගණය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2015" යනුවෙන් සඳහන් කළ යුතුය.

නියමිත සුදුසුකම් සපුරා නැති හෝ සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත්‍රය ලැබුණු බව දන්වනු නොලබන අතර, අයදුම්පත්‍රය හෝ ඒ හා සම්බන්ධ ලිපියක් හෝ තැපෑලේ දී නැතිවූ බවට කරන පැමිණිලි ගැන සළකා බලනු නොලැබේ. එබැවින් නියමිත දිනට හෝ එදිනට පෙර අයදුම්පත් එවීම අයදුම්කරුගේ වගකීම වේ.

14. *විභාගයට ඇතුළත් වීම :*

(අ) අදාළ විභාග ගාස්තු ගෙවා නිසි ලෙස ඉල්ලුම්පත් සම්පූර්ණ කර නියමිත දිනට පෙර එවා ඇති සියලුම ඉල්ලුම්කරුවන් වෙත යථා කාලයේදී ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින අපේක්ෂකයකු විසින් නිසි පරිදි අත්සන සහතික කළ තම ප්‍රවේශ පත්‍රය විභාග ශාලාධිපතිට ඉදිරිපත් කළ යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ආ) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නියම කරන ලද නීතිරීති උල්ලංඝනය කළහොත් අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදු වනු ඇත.

15. *අපේක්ෂකයාගේ අනන්‍යතාවය :*

තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන් ම ශාලාධිපති සෑහීමට පත්වන අයුරින් අපේක්ෂකයෙකු විභාග ශාලාවේ දී තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතු ය. මේ සඳහා පහත සඳහන් ලේඛනවලින් එකක් පමණක් පිළිගනු ඇත.

I. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත,

II. වලංගු විදේශ ගමන් බලපත්‍රය

III. වලංගු රියදුරු බලපත්‍රය

16. *පත් කිරීම සඳහා තෝරා ගැනීම :*

ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතාවයන් අනුපිළිවෙල අනුව අපේක්ෂකයින් අතරින් පුරප්පාඩු සංඛ්‍යාවට සමාන පිරිසක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර බඳවා ගනු ලැබේ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට ලකුණු ලබා දෙනු නොලැබේ. තනතුරු වලට අදළ නිලධාරීන් බඳවා ගැනීමේදී හුදෙක් සුදුසුකම් සහතික සහ මනා සෞඛ්‍ය තත්ත්වය පරීක්ෂා කර බැලීම සඳහා පමණි.

17. සාවද්‍ය තොරතුරු සැපයීම :

අපේක්ෂකයෙකු සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක්, ඔහු එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළි වුවහොත් එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු ඕනෑකමින් යටපත් කර ඇති නම් ඔහු රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

මෙම රෙගුලාසිවල සලකා නොමැති කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කරන පරිදි කටයුතු කෙරෙනු ඇත.

සිංහල හා දෙමළ මාධ්‍යවලින් පළ කරනු ලබන මෙම දැන්වීමෙහි එක් එක් භාෂාවලින් පළකිරීමේ දී යම් නොගැලපීමක් ඇතිවුවහොත් සිංහල මාධ්‍යයෙන් පළ කරන ලද දැන්වීම බලාත්මක වේ.

අධ්‍යක්ෂ ජනරාල්,
ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව.

2015 ඔක්තෝබර් මස 07 වැනි දින,
මාලිගාවත්ත,
කොළඹ 10.

**ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර III ශ්‍රේණිය - තාක්ෂණික සේවා ගණය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2015**

| | |
|---|---|
| විභාග අංකය :<br>කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා | ☐ |
| විභාගයට පෙනී සිටින මාධ්‍යය ☐<br>සිංහල - 2, දෙමළ - 3,<br>(අදාළ අංකය කොටුව තුළ ලියන්න)<br>විභාග මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. | අයදුම්කරන තනතුර/තනතුරු<br>I. ————.<br>II. ————.<br>III. ————. |

1.0 නම :

1.1 මුලකුරු සමග නම : Mr./Mrs./Miss :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා. : Mr. SILVA A. B.

1.2 සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.3 සම්පූර්ණ නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)

1.4 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

2.0 2.1 ස්ථිර ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.2 ස්ථිර ලිපිනය :————.
(සිංහලෙන්/දෙමළෙන්)

2.3 රාජකාරි ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.4 රාජකාරි ලිපිනය :————.
(සිංහලෙන්/දෙමළෙන්)

2.5 ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

2.6 දුරකථන අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

3.0 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී - 1 පුරුෂ - 0 ☐
(අදාළ අංකය ලියන්න)

3.2 විවාහක/අවිවාහක බව : විවාහක - 1 අවිවාහක - 2 ☐
(අදාළ අංකය ලියන්න.)

3.3 උපන් දිනය :

වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

3.4 අයදුම්පත් කැඳවන අවසන් දිනට වයස :

අවුරුදු ☐☐ මාස ☐☐ දින ☐☐

4.0 අධ්‍යාපන සුදුසුකම් :

4.1 අ. පො. ස. (උ/පෙළ) :

විභාග අංකය :————. වර්ෂය :————.

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |

4.2 අ. පො. ස. (සා/පෙළ) :

විභාග අංකය :————. වර්ෂය :————.

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

4.3 වෘත්තීය සුදුසුකම් :

.....................................................................................................................................
.....................................................................................................................................
.....................................................................................................................................

5.0 ගෙවන ලද විභාග ගාස්තුව :

(i) අංකය :————. (iii) මුදල් ගෙවූ ස්ථානය :————.
(ii) දිනය :————. (iv) ගෙවන ලද මුදල රුපියල් :————.

| මුදල් ගෙවූ රිසිට් පතෙහි මුල් පිටපත මෙහි අමුණන්න. |
|---|

***අයදුම්කරුගේ සහතිකය***

මෙහි සඳහන් කර ඇති තොරතුරු මගේ දැනීම හා විශ්වාසය පරිදි සත්‍ය බවත්, විභාග ගාස්තුව ගෙවන ලද අංක ............ හා ............ දින දරන මුදල් කුවිතාන්සිය මීට අමුණා ඇති බවත්, ප්‍රකාශ කරමි. විභාගය බලපවත්නා නියමයන්ටත් විභාගයේ නීති රීති අනුව මා නුසුදුසු බව දක්නට ලැබුනහොත් විභාගයට පෙර හෝ විභාගය පවත්වන අතරතුරේ දී හෝ විභාගයෙන් පසු හෝ මාගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන යම්

තීරණයන් වෙතොත් ඊටත් මම එකඟ වෙමි. තව ද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

―――――,
අයදුම්කරුගේ අත්සන.

දිනය :―――――.

*දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය*

(දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අපේක්ෂකයකු/අපේක්ෂිකාවක් නම් පමණි.)

…………………… මහතා/මෙනවිය/මිය මෙම ආයතනයේ ………… තනතුරෙහි සේවය කරන බවත් මේ දක්වා අවවාද කිරීමක් හැර කිසිදු විනය දඬුවමකට ලක් වී නොමැති බවත් සහතික කරමි.

තවද, මෙම අයදුම්පතේ සපයා ඇති තොරතුරු නිවැරදි බව ද නියමිත විභාග ගාස්තුව ගෙවා එම ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

මේ නිලධාරියා/නිලධාරිනිය තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් වහාම මුදාහළ හැකි/නොහැකි බවද සඳහන් කරමි.

―――――,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන සහ
නිල මුද්‍රාව.

දිනය :―――――.

අත්සන් කරන අයගේ නම :―――――.
තනතුර :―――――.
ආයතනයේ නම :―――――.

10-865

---

**ඉඩම් අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව

**ශ්‍රී ලකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙහි පුරප්පාඩුව පවත්නා ප්‍රාථමික අර්ධ ශිල්පීය (PL02-2006A) තනතුරුවලට බඳවා ගැනීම - මැනුම් ක්ෂේත්‍ර සහායක**

1.0 මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙහි, පුරප්පාඩුව පවත්නා ප්‍රාථමික අර්ධ ශිල්පීය (PL 02-2006A) මැනුම් ක්ෂේත්‍ර සහායක තනතුර සඳහා බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *1.1 බඳවා ගන්නා තනතුර* | *ශ්‍රේණිය* |
|---|---|
| 1. මැනුම් ක්ෂේත්‍ර සහායක | III ශ්‍රේණිය |

*1.2 තනතුරෙහි රාජකාරි ස්වභාවය :*

| *තනතුර* | *ප්‍රධාන කාර්යයන්* |
|---|---|
| මැනුම් ක්ෂේත්‍ර සහායක | • මැනුමට අදළ දළ සැලැස්ම ඇඳීමට සහාය වීම<br>• මැනුම් ක්ෂේත්‍ර පොත් සහ පිඹුරු උපයෝගී කරගෙන පැරණි මායිම් නිරීක්ෂණය කිරීමට හැකිවන සේ මැනුම් රේඛා සකස් කිරීම<br>• මැනුමට අදළ වන ක්ෂේත්‍රයේ පැරණි මායිම්වල අදළ කුඤ්ඤ, මායිම් ගල් පිහිටුවීම සහ විවෘත කිරීම<br>• මැනුමට අදළ පිල් ලකුණු සොයා ගැනීම හා පිහිටුවීමට අදළ මැනුම් රාජකාරිවලට සහාය වීම<br>• ක්ෂේත්‍රයේදී භාවිතා කරන උපකරණ ආරක්ෂා කිරීම සහ ගබඩා කර ගැනීමට අදළ නඩත්තු කටයුතුවලට සහාය වීම |

- විකෝණමාන ලෙවල් උපකරණ සහ නව ඉලෙක්ට්‍රොනික් පූර්ණමාන ඇතුළු චන්ද්‍රිකා තාක්ෂණය ඇසුරෙන් කරනු ලබන මැනුම් සඳහා වූ G. P. S. උපකරණ ක්ෂේත්‍රයේ මැනුම් ලක්ෂවල ස්ථානගත කිරීම
- ගුවන් ඡායාරූපකරණයට අවශ්‍ය භූමි පාලන ලක්ෂයන් ස්ථානගත කිරීමේ සියළුම කටයුතු සඳහා සහාය වීම.
- මැනුම් කටයුතුවලදී ගනු ලබන සියළුම ස්ථානවල පිහිටීම හා මට්ටම නිර්ණය කිරීම සඳහා අවශ්‍ය ඉලක්කයන් දර්ශක විධිමත් අයුරින් තබා ගැනීම, මැනුම් දත්ත එක්රැස් කිරීමට සහාය දැක්වීම
- මැනුම් කටයුතුවලදී නිවැරදි දත්ත භාවිතා කර මායිම් ගල්, පිල් ලකුණු භූමියේ පිහිටුවීම
මැනුම් ක්ෂේත්‍ර පොත් හා අනුරේඛන සටහන්වල දත්ත උපයෝගී කරගෙන මූලිකවම කරනු ලබන ඉඩම් කට්ටි කිරීමට අදළ මායිම් ගල් පිහිටුවීම.
- සර්වේයර් ජනරාල් විසින් හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් පවරනු ලබන ඉඩම් මැනුම් සම්බන්ධ ඕනෑම රාජකාරියක නිරතවීම
- මැනුම් ක්ෂේත්‍ර සහායක ශ්‍රේණියේ ඕවර්සියර් තනතුර දරන තැනැත්තන් හට ඉහත රාජකාරිවලට අමතරව, අනෙකුත් මැනුම් ක්ෂේත්‍ර සහායකයන්ගේ කාර්යයන් අධීක්ෂණය ද පැවරේ.

2.0 පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම් දිනය පත්වීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. පුරප්පාඩු සියල්ලම හෝ කිසියම් ගණනක් නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

3.0 *වැටුප* :

වගුව - අංක 01

| *ශ්‍රේණිය* | *වැටුප් පරිමාණය* | *ආරම්භක මාසික වැටුප* |
|---|---|---|
| III ශ්‍රේණිය | මාසිකව රු. 12,210 - 10 x 130 - 10 x 145 - - 10 x 160 - 12 x 170 - රු. 18,600 (පීඑල්2 - 2006ඒ) | රු. 12,210 |
| II ශ්‍රේණිය | මාසිකව රු. 12,210 - 10 x 130 - 10 x 145 - - 10 x 160 - 12 x 170 - රු. 18,600 (පීඑල්2 - 2006ඒ) | රු. 13,655 |
| I ශ්‍රේණිය | මාසිකව රු. 12,210 - 10 x 130 - 10 x 145 - - 10 x 160 - 12 x 170 - රු. 18,600 (පීඑල්2 - 2006ඒ) | රු. 15,120 |
| විශේෂ ශ්‍රේණිය | මාසිකව රු. 12,210 - 10 x 130 - 10 x 145 - - 10 x 160 - 12 x 170 - රු. 18,600 (පීඑල්2 - 2006ඒ) | රු. 16,730 |

4.0 මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වන අතර, තෝරා ගනු ලබන අයදුම්කරුවන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සූදානම්ව සිටිය යුතුය. මෙම ගැසට් නිවේදනයේ ආරම්භයේ ඇති රාජ්‍ය සේවයට පත් කිරීම් වලට ආදළ වන පොදු කොන්දේසිවලට යටත් විය යුතු ය.

5.0 සුදුසුකම් :

5.1 *අධ්‍යාපන සුදුසුකම්* :-

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හය (06) ක් සමත්වී තිබීම.

5.2 *වෘත්තීය සුදුසුකම්* :-

මැනුම් ක්ෂේත්‍ර සහායක තනතුරට නියමිත පරිදි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවයන්හි (NVQ) අවම වශයෙන් දෙවන මට්ටමේ නිපුණතාවයක් ලබාගෙන තිබීම.

5.3 අවම නිපුණතා

(අ) මැනුම් ක්ෂේත්‍ර හඳුනා ගැනීමට සහාය වීම

(ආ) මැනුම් උපකරණ හා ආම්පන්න ආරක්‍ෂා කිරීම හා නඩත්තුව

5.4 කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත්, ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

5.5 *වෙනත් සුදුසුකම් :*

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
(ii) අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
(iii) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

5.6 *වයස :*

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට අවම වයස අවුරුදු 18 වන අතර, උපරිම වයස අවුරුදු 45 වේ.

(රජයේ සේවයේ ස්ථිර තනතුරක් දරන අය සඳහා උපරිම වයස් සීමාව අදාල නොවේ.)

6.0 *සාවද්‍ය තොරතුරු සැපයීම :*

මෙම පුරප්පාඩු පිරවීමේ දී කිසියම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් ඕනෑම අවස්ථාවක දී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. සේවයට බඳවා ගත් පසුව වුව ද අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් තොරතුරක් එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෝ යම් වැදගත් කරුණක් ඕනෑකමින් වසන් කර ඇති බව පෙනී ගියහොත් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

7.0 *බඳවා ගැනීමේ ක්‍රමය.*—ලිඛිත විභාගයක් මගිනි.

*විභාග පරිපාටිය :*

විභාගය විෂයයන් දෙකකින් යුත් ලිඛිත පරීක්ෂණයකි. මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වෙන අතර, ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| | *ලැබිය හැකි මුළු ලකුණු ප්‍රමාණය* | *සමත්වීම සඳහා ලැබිය යුතු අවම ලකුණු ප්‍රතිශතය* | *කාලය* |
|---|---|---|---|
| (i) සාමාන්‍ය දැනීම | 100 | 40% | පැය 02 |
| (ii) බුද්ධි පරීක්ෂණය | 100 | 40% | පැය 01 විනාඩි 15 |

7.1 *විෂය නිර්දේශය :*

(i) *සාමාන්‍ය දැනීම.*—මෙම ප්‍රශ්න මගින් අපේක්ෂකයා වාසය කරන පරිසරය ඇතුළුව ශ්‍රී ලංකාවේ දේශපාලනමය, සමාජමය, සංස්කෘතික, ආගමික හා ආර්ථික පරිසරයද විද්‍යාත්මක හා කාර්මික සංවර්ධනය ද අන්තර්ජාතිකව වැදගත් වන සාමාන්‍ය කරුණු පිළිබඳ දැනුම ද අපේක්ෂා කෙරේ.

(ii) බුද්ධි පරීක්ෂණය : අපේක්ෂකයාගේ සිතීමේ ශක්තිය, තර්කානුකූලභාවය, අවස්ථානෝචිත තීරණ ගැනීමේ හැකියාවද මැනීම සඳහා වූ බහුවරණ ක්‍රමයට සකස් කෙරෙන ප්‍රශ්න පත්‍රයකි.

8.0 *තේරීම් පරිපාටිය :*

8.1 මැනුම්පති විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයකින් අයදුම්කරුවන්ගේ සුදුසුකම් සනාථ කරන සහතික පරීක්ෂා කිරීම සඳහාම පමණක් වන සම්මුඛ පරීක්ෂණයකින් පසු ලිඛිත විභාගයේදී අයදුම්කරුවන් ලබාගත් ලකුණු කුසලතා අනුපිළිවෙල මත පමණක් III ශ්‍රේණියේ මැනුම් ක්ෂේත්‍ර සහායක වශයෙන් බඳවා ගනු ලැබේ.
බඳවා ගන්නා මැනුම් ක්ෂේත්‍ර සහායකයන් හට එක් මසක ක්ෂේත්‍ර හා න්‍යායික පුහුණුවක් මිනින්දෝරු දෙපාර්තමේන්තු පුහුණු කිරීමේ ආයතන මගින් ලබා දෙනු ඇත.

9.0 *අයදුම්පත්‍ර සකස් කිරීම හා ඉදිරිපත් කිරීම :*

(අ) මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව සෙ. මී. 21 x 29 (ඒ4) ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් තමන් විසින් ඉල්ලුම් පත්‍රය සකස් කරගත යුතුය. අංක 01 සිට 06 දක්වා ශීර්ෂ 01 පිටුවේ ද, අංක 07 - 09.2 දක්වා ශීර්ෂ 02 පිටුවේ ද, අංක 10 - 14 දක්වා ශීර්ෂ 03 පිටුවේ ද, අංක 15 - 16.2 දක්වා ශීර්ෂ 04 පිටුවේ ද, ඇතුලත් වන පරිදි ඉල්ලුම් පත්‍රය සැකසිය යුතු ය.

(ආ) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු ඉල්ලුම්කරුවන් අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ද, රාජ්‍ය සංස්ථා, පළාත් පාලන ආයතන ආදියේ සේවයේ නියුතු වූවන් සිය ආයතන ප්‍රධානීන් මගින් ද නියමිත දිනට හෝ පෙර ඉදිරිපත් කල යුතුවේ.

(ඇ) ඉල්ලුම්පත් සකස් කල යුත්තේ තමා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයෙන් ය.

(ඈ) නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරා ගත යුතුය. ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ දැක්වෙන ඉල්ලුම් පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

(ඉ) ඉල්ලුම්පත් ලද බව දන්වනු නොලැබේ. තැපෑලේ දී අස්ථානගත වන ඉල්ලුම්පත් සම්බන්ධව කෙරෙන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

9.1 අයදුම්පත් බාර ගන්නා අවසන් දිනයට *ගැසට් නිවේදනයේ 5 ඡේදයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති අය පමණක් ඉල්ලුම් කළ යුතුවේ. නියමිත විභාග ගාස්තු ගෙවා* 2015.11.20 දිනට හෝ එදිනට පෙර හෝ ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන්ට තරග විභාගටය පෙනී සිටීමට සර්වේයර් ජනරාල් විසින් ඉඩදෙනු ලැබේ. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම විභාගයට පෙනී සිටීමට හෝ මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

9.2 අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම් පස ඉහළ කෙලවරේ "ප්‍රාථමික අර්ධ ශිල්පීය තනතුරුවලට බඳවා ගැනීම - මැනුම් ක්ෂේත්‍ර සහායක" යනුවෙන් පැහැදිලිව සඳහන් කල යුතු ය.

9.3 අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ *ගැසට්* කල තනතුරක් දරන නිලධාරියෙකු, හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 ශ්‍රේණිගත කිරීම අනුව තෘතීය හෝ ජ්‍යෙෂ්ඨ මට්ටමේ රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

10.0 *විභාග ගාස්තු :*

විභාග ගාස්තුව රු. 800 කි. මෙම මුදල කොළඹ 05, කිරුළ පාර, අංක 150 ස්ථානයේ පිහිටි මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ සරප් අංශයට හෝ ඕනෑම දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයකට හෝ මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය-දියතලාව වෙත ගෙවා ලබාගත් රිසිට්පත අයදුම්පතෙහි ඒ සඳහා වෙන්කර ඇති ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. (රිසිට්පතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතුය.) කිසිම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර, මුදල් ඇනවුම් හෝ චෙක්පත් භාර ගනු නොලැබේ. රිසිට්පත් නොමැතිව ඉදිරිපත් කරන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

11.0 *අයදුම් පත්‍ර යොමු කිරීම :*

සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2015 නොවැම්බර් මස 20 වැනි දින හෝ ඊට පෙර පහත දැක්වෙන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි (විභාග),
සර්වේයර් ජනරාල් කාර්යාලය,
කොළඹ 05.

12.0 *විභාගයට පෙනී සිටීම :*
විභාගයට පෙනී සිටින අපේක්ෂකයෙකු විභාග මධ්‍යස්ථානයේ විභාග ශාලාධිපතිට තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදීම විභාගයට පෙනී සිටිය යුතු ය.

13.0 අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය :

විභාග ශාලාවේ දී තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන අයුරින් අයදුම්කරුවන් තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ලේඛන පිළිගනු ඇත.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත,
(ii) තැපැල්පති විසින් නිකුත් කර ඇති වලංගු හැඳුනුම්පත,
(iii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

14.0 මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව සර්වේයර් ජනරාල් විසින් තීරණය කරනු ඇත. සියළුම අයදුම්කරුවන් මෙම ගැසට් පත්‍රයේ සඳහන් පොදු විභාග නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

පී. එම්. පී. උදයකාන්ත,
සර්වේයර් ජනරාල්.

2015 ඔක්තෝබර් මස 09 වැනි දින,
සර්වේයර් ජනරාල් කාර්යාලය,
කොළඹ 05.

*ආදර්ශ අයදුම්පත්‍රය*

*ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවත්නා ප්‍රාථමික අර්ධ ශිල්පීය (PL 2-2006A) තනතුරුවලට බඳවා ගැනීම - මැනුම් ක්ෂේත්‍ර සහායක*

[ ]
කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි.

01. විභාග අංකය ඃ

02. විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය ඃ [ ]
(සිංහල - S, දෙමළ - T, ඉංග්‍රීසි - E )
(දෙන ලද කොටු තුළ සංකේතය/අංකය යොදන්න.)

03. මුල්'කුරු සමග නම : (මයා/මිය/මෙනවිය)
සිංහලෙන් :————.
ඉංග්‍රීසියෙන් :————.

03.1 මුල්'කුරු වලින් හැඳින්වෙන නම් (පැහැදිලි අකුරෙන්) ඃ
සිංහලෙන් :————.
ඉංග්‍රීසියෙන් :————.

04. ජාතික හැඳුනුම්පත් අංකය :————.

05. උපන් දිනය : *වර්ෂය* :————. *මාසය* :————. *දිනය* :————.

05.1 ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස ඃ *අවු.* :————. *මාස* :————. *දින* :————.

06. ස්ත්‍රී/පුරුෂ භාවය ඃ (පුරුෂ - M ස්ත්‍රී - F) [ ]

07. ස්ථිර ලිපිනය (පැහැදිලි අකුරෙන්) :————.
සිංහලෙන් :————.
ඉංග්‍රීසියෙන් :————.

07.1 ලිපිනය අයත් වන පරිපාලන දිස්ත්‍රික්කය ඃ (උපලේඛනය 1 බලන්න)

දිස්ත්‍රික් අංකය ඃ [ ] දිස්ත්‍රික්කයේ නම ඃ [ ]

07.2 දිස්ත්‍රික්කයේ පදිංචිව සිටින්නේ කවදා සිට ද? :————.

08. දුරකථන අංකය ඃ ස්ථාවර :————. ජංගම :————.

09. අධ්‍යාපන සුදුසුකම් ඃ

9.1 අ. පො. ස. (සා. පෙ.) විභාගය පිළිබඳ විස්තර ඃ

*පළමුවර ඃ*

(i) විභාග වර්ෂය හා මාසය :—————.
(ii) විභාග අංකය :—————.
(iii) සමත් වූ විෂයයන් :

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1. | | 5. | |
| 2. | | 6. | |
| 3. | | 7. | |
| 4. | | 8. | |

9.2 අ. පො. ස. (සා. පෙ.) විභාගය පිළිබඳ විස්තර ඃ

දෙවනවර ඃ

(i) විභාග වර්ෂය හා මාසය :—————.
(ii) විභාග අංකය :—————.
(iii) සමත් වූ විෂයයන් :—————.

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1. | | 5. | |
| 2. | | 6. | |
| 3. | | 7. | |
| 4. | | 8. | |

10. වෘත්තීය සුදුසුකම් ඃ (ලබා ගෙන ඇති NVQ නිපුණතාවය පිළිබඳ විස්තර සඳහන් කරන්න.) :—————.

11. වෙනත් සුදුසුකම් :—————.

12. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද? ඃ

( ✓) ලකුණ යොදන්න.

ඔව් ඃ ☐ නැත ඃ ☐

12.1 ඔව් නම් විස්තර සඳහන් කරන්න. :—————.

13. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර ඃ

(i) විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :—————.
(ii) ලදුපත් අංකය හා දිනය :—————.
(iii) ගෙවූ මුදල :—————.

ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න.

14. අයදුම්කරුගේ සහතිකය ඃ

(අ) මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි.

(ආ) මා විසින් කරනු ලැබ ඇති මෙම ප්‍රකාශය අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සෙකු වන බව හා පත්වීම ලැබීමෙන් පසු එසේ ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව දැන සිටිමි.

(ඇ) රු. ......ක් ගෙවා ලබාගත් ලදුපත අදාල ස්ථානයේ අලවා ඇත.

(ඈ) තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් සර්වේයර් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

(ඉ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

—————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

15. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම ඃ

මෙම අයදුම්පත ඉදිරිපත් කරන .................. නමැති අය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ඇය ...... දින මා ඉදිරිපිටදී ඉහත 14 ඡේදය යටතේ අත්සන තබන ලද බවත් සහතික කරමි.

—————,
සහතික කරන්නාගේ අත්සන.

දිනය :—————.
සහතික කරන්නාගේ නම :—————.
තනතුර :—————.
ලිපිනය :—————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

16. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය ඃ (රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි)

16.1 නිලධාරියාගේ පෞද්ගලික ලිපිගොනුව අනුව, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර පහ තුළ-
වැඩ, හැසිරීම, පැමිණීම සතුටුදායකය/අසතුටුදායකය.
සියලු වැටුප් වර්ධක උපයාගෙන ඇත/නැත.
කිසිඳු විනය දඬුවමකට ලක්ව ඇත/නැත.

16.2 ඉල්ලුම් කරනු ලබන තනතුරට තෝරාගනු ලැබුවහොත් වර්තමාන තනතුරින් මෙම නිලධාරියා මුදා හැරිය හැකිය/නොහැකිය. අයදුම්පත නිර්දේශ කරමි/නොකරමි.

—————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
නිල මුද්‍රාව.

දිනය :—————.

## උපලේඛනය I

ආදර්ශ අයදුම් පත්‍රයේ ශීර්ෂ අංක 07.1හි සඳහන් ලිපිනය අයත් වන පරිපාලන දිස්ත්‍රික්කය සඳහා මෙම ලේඛනය අදාළ වේ.

| *නගරය/දිස්ත්‍රික්ක නම* | *නගර/දිස්ත්‍රික්ක අංකය* |
|---|---|
| 1. කොළඹ | 01 |
| 2. ගම්පහ | 02 |
| 3. කළුතර | 03 |
| 4. මහනුවර | 04 |
| 5. මාතලේ | 05 |
| 6. නුවරඑළිය | 06 |

| *නගරය/දිස්ත්‍රික්ක නම* | *නගර/දිස්ත්‍රික්ක අංකය* |
|---|---|
| 7. ගාල්ල | 07 |
| 8. මාතර | 08 |
| 9. හම්බන්තොට | 09 |
| 10. කුරුණෑගල | 10 |
| 11. පුත්තලම | 11 |
| 12. අනුරාධපුරය | 12 |
| 13. පොළොන්නරුව | 13 |
| 14. බදුල්ල | 14 |
| 15. මොණරාගල | 15 |
| 16. රත්නපුර | 16 |
| 17. කෑගල්ල | 17 |
| 18. අම්පාර | 18 |
| 19. මඩකළපුව | 19 |
| 20. ත්‍රිකුණාමලය | 20 |
| 21. යාපනය | 21 |
| 22. වවුනියාව | 22 |

10-912

---

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුගත) තනතුර සඳහා බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2015

Limited Competitive Examination for Recruitment to Assistant Commissioner (Departmental) - Department of Probation and Child Care Services - 2015

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුගත) තනතුර සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. *බඳවා ගැනීමේ ක්‍රමය :*

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයකට හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අනතුරුව, ලිඛිත විභාගයේ දී හා සම්මුඛ පරීක්ෂණයේ දී ලබා ගත් මුළු ලකුණුවල එකතුව මත රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සුදුසු අයදුම්කරුවන් බඳවා ගනු ලැබේ.

මෙම පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය අනුව තීරණය කරනු ලැබේ.

2. *අවශ්‍ය සුදුසුකම් :*

(i) අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් :

* පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් හිමි I පන්තියේ වසර 5ක් හෝ ඊට වැඩි සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් ඇති ක්ෂේත්‍රගත/කාර්යාලගත බණ්ඩ 2 සේවා ගණයේ (MN 05-2006A) තනතුරු දරන පරිවාස නිලධාරීන්, ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන් සඳහා මෙම තනතුරට ඉල්ලුම් කළ හැකිය.
* පූර්වාසන්න පසුගිය පස් අවුරුදු කාලය තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

(ii) කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(iii) වෙනත් සුදුසුකම් :

- ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.
- අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
- අයදුම්පත් කැඳවනු ලබන අවසන් දිනට මෙම තනතුර සඳහා බඳවා ගැනීමට අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

(iv) වයස් සීමාව :

දැනට රාජ්‍ය සේවයේ නියුතු වූවන් සඳහා වන බැවින් වයස් සීමාව අදාළ නොවේ.

3. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු, විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

(ii) පත්වීම එක් අවුරුදු වැඩ බැලීමේ කාලයකට යටත්ය. සහකාර කොමසාරිස් III වන ශ්‍රේණියට බඳවාගෙන වසර 03ක් ඇතුළත බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්විය යුතුය.

(iii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014ට අනුව හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව තනතුරට බැඳී වසර 05ක් ඇතුලත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව අදළ පරිදි ලබා ගත යුතුය.

(iv) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වලටද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයටද, රජයේ මුදල් රෙගුලාසි වලටද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝග වලට ද මෙම පත්වීම යටත් වේ.

4. *වැටුප් පරිමාණය* :

මෙම තනතුරට රු. 22,935- 10x645-8x790-17x1,050-රු. 53,555 මාසික වැටුප් පරිමාණයක් හිමිය. (2006.04.25 දිනැති රා. ප. ච. අංක 06/2006 හි අංක -SL-1-2006 වැටුප් බණ්ඩය.)

5. *ලිඛිත පරීක්ෂණය* :

(i) රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් 2016 පෙබරවාරි මස කොළඹ දී පවත්වනු ලැබේ.

(ii) විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා වලින් පැවැත්වේ.

(iii) අයදුම්කරුවකුට ඉහත දක්වා ඇති භාෂා වලින් එකකින් විභාගයට පෙනී සිටිය හැක. එසේ වුවද ඔහු/ඇය තමන් තෝරාගත් එක් භාෂාවකින් පමණක් සියළුම විෂයයන්ට පෙනී සිටිය යුතුය. ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(iv) ලිඛිත විභාගය පහත සඳහන් විෂයයන් පිළිබඳ ප්‍රශ්නපත්‍ර වලින් සමන්විත වේ.

| *විෂය අංකය* | *විෂයය* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|---|
| 01 | විෂයානුබද්ධ අධ්‍යයනය | පැය 1 1/2 | 100 | 40% |
| 02 | බුද්ධි පරීක්ෂණය | පැය 1 | 100 | 40% |

*ලිඛිත පරීක්ෂණයේ විෂය නිර්දේශය* :

(අ) විෂයානුබද්ධ අධ්‍යයනය :
පරිවාස ක්ෂේත්‍රයට අදළ ආඥපනත් වන ළමා සුභ සාධනය හා සංවර්ධනය, ළමා රැකවරණය, ළමා වරදකරුවන් පුනරුත්ථාපනය, ළමයින් හා යෞවනයන් පිළිබඳ ආඥපනත, වරදකරුවන් පරිවාස භාරයේ තැබීමේ ආඥපනත, අනාථ ළමා නිවාස ආඥපනත, ළමයින් දරුකමට හදා වඩා ගැනීමේ ආඥපනත, දඩ මුදල් ගෙවීමේ ආඥපනත, අයාල ආඥපනත, තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාල ආඥපනත හා සම්බන්ධ ප්‍රායෝගික ප්‍රශ්න පත්‍රයකි.

(ආ) බුද්ධි පරීක්ෂණය :

අයදුම්කරුගේ නිර්මාණාත්මක චින්තන ශක්තිය, ගැටලු නිරාකරණය කිරීමේ හැකියාව හා විශ්ලේෂණාත්මක හැකියාව මැන බැලීම සඳහා වූ කෙටි ප්‍රශ්න පත්‍රයකි. මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50කින් සමන්විත වන අතර ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

6. *ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය* :

සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන්නේ ලිඛිත පරීක්ෂණයේ දී එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා අවම වශයෙන් 40% ක් හෝ ඊට වැඩි ලකුණු ලබාගත් අයදුම්කරුවන් පමණි. එහෙත් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අයදුම්කරුවන් සංඛ්‍යාව පිරවිය යුතු පුරප්පාඩු සංඛ්‍යාව මෙන් පස් ගුණයකට නොවැඩි වනු ඇත.

සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු 100ක් හිමි වේ. කිසිම හේතුවක් නිසාවත් අවම ලකුණු සංඛ්‍යාව අඩු කරනු නොලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් සම්මුඛ පරීක්ෂණය පවත්වන අතර සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දෙන ආකාරය පහත පරිදි වේ. :

| *විෂයය* | *උපරිම ලකුණු* |
|---|---|
| 01. අමතර අධ්‍යාපන සුදුසුකම් | 20 |
| 02. ක්ෂේත්‍රයට අදළව ලබා ගෙන ඇති වෘත්තීය සුදුසුකම් | 25 |
| 03. සේවා පළපුරුද්ද | 40 |
| 04. භාෂා ප්‍රවීණතාවය | 10 |
| 05. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාව | 05 |
| මුළු එකතුව | 100 |

*අයදුම්කරන ආකාරය* :

(i) අයදුම්පත්‍ර, ආදර්ශ ආකෘතියට අනුව A4 පත්‍රයක සකස් කොට ඉදිරිපත් කළ යුතුය. A4 පත්‍රයේ දෙපසම පාවිච්චි කළ යුතු අතර අයදුම්පත්‍රයේ ශීර්ෂ අංක 01 සිට 08 දක්වා පළමු පිටුවට ද, ඉතිරිය පිළිවෙලින් අනෙකුත් පිටුවලට ද ඇතුලත් වන සේ අයදුම්පත සකස් කළ යුතුය. අයදුම්පත අපේක්ෂකයාගේ අත් අකුරින්ම පැහැදිලිව පිරවිය යුතුය. අයදුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම, සිංහල අයදුම්පත්‍රවල සිංහලවලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළවලට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතුය.

ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍ර සහ අසම්පූර්ණ තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍ර දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඔබ විසින් ඉදිරිපත් කරන අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(ii) අපේක්ෂකයා/අපේක්ෂිකාව විභාගයට පෙනී සිටීමට අදහස් කරන භාෂා මාධ්‍යයෙන් අයදුම්පත පිළියෙළ විය යුතුය.

(iii) සම්පූර්ණ කරන ලද අයදුම්පත කොළඹ, තැ. පෙ. 1503 ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, විභාග කොමසාරිස් ජනරාල් වෙත 2015 නොවැම්බර් මස 23 වන ද හෝ ඊට ප්‍රථම ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතුය. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් බහා එවන කවරයේ වමත්පස ඉහළ කෙළවරේ "පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුගත) තනතුර සඳහා බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2015" යනුවෙන් පැහැදිලිව සලකුණු කර තිබිය යුතුය.

(iv) සෑම අතින්ම සම්පූර්ණ නොවූ අයදුම්පත් ප්‍රතික්ෂේප වනු ඇත. තැපෑලේ දී යම් අයදුම්පතක් නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට හෝ ඉදිරිපත් කෙරෙන පැමිණිලි සළකා බලනු නොලැබේ.

(v) නිවේදනයේ සඳහන් අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදළ ලදුපත සමඟ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති

අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත.

(vi) විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනයේ සඳහන් විභාගය පැවැත්වෙන දිනයට අවම වශයෙන් දින පහකටවත් පෙර තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයෙක් වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හා විදේශ විභාග ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම්, එම විස්තර සමඟ, ෆැක්ස් මඟින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක්ද සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින්ම විමසා සිටීම වඩාත් ඵලදායි වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

(vii) අයදුම්පත්‍රයේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් ආයතනයකින් විභාගයට ඉල්ලුම්කරන අයදුම්කරුවෙකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා ද, එසේ නොවන අයදුම්කරුවෙකු තම අත්සන රජයේ පාසැලක ප්‍රධානියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියකු රු. 240,360 ක් හෝ ඊට වැඩි හෝ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ ලවා සහතික කරවාගත යුතුය.

8. *විභාගයට ප්‍රවේශය* :

(i) සම්පූර්ණ අයදුම්පත් එවූ සුදුසුකම් සපුරා ඇති සියලුම දෙනාට විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින අයදුම්කරුවකු අත්සන සහතික කරවාගත් තම ප්‍රවේශ පත්‍රය විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයකුට/අපේක්ෂිකාවකට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති වලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට/ඇයට සිදුවනු ඇත.

(ii) අයදුම්කරුවකු විභාගයට පෙනී සිටිය යුත්තේ ඔහුට/ඇයට නියම කරන ලද විභාග ශාලාවේ දීය. සෑම අපේක්ෂකයකු/ අපේක්ෂිකාවකම විභාගයට පෙනී සිටින පළමු වන දිනයේ දීම තම ප්‍රවේශ පත්‍රය විභාග ශාලාධිපතිට භාර දිය යුතුය. සියලුම අයදුම්කරුවන් විසින් පිළිපැදිය යුතු නීති මාලාවක් මේ ගැසට් පත්‍රයේ පළවේ.

**සටහන** :

අපේක්ෂකයකුට ප්‍රවේශපත්‍රයක් නිකුත් කළ පමණින් ඔහු/ඇය ගැසට් නිවේදනයෙන් අපේක්ෂිත සුදුසුකම් සපුරා ඇති බවක් නොහැඟේ.

9. *විභාග ප්‍රතිඵල* :

ලිඛිත හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණවල මුළු ලකුණුවල ප්‍රමුඛතාව මත සකස් කළ ප්‍රතිඵල ලේඛන ලේකම් රාජ්‍ය සේවා කොමිෂම වෙත ලබාදෙනු ඇත. විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.results.exams.gov.lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කරනු ඇත.

10. විභාග ගාස්තුව රු. 1,000 ක් වේ. මෙම මුදල අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 යටතේ රජයේ ආදායමට බැර වන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උප තැපැල් කාර්යාලයක් වෙත මුදලින් ගෙවා අයදුම්කරුගේ නමින් ලබා ගන්නා ලදුපත, එහි එක් දරයක් මඟින් අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන ලෙස ඇලවිය යුතුය. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලැබේ.

***සටහන*** :

කවර හේතුවක් නිසා වුවද විභාගයෙන් ඉවත් වන හෝ නොපැමිණ සිටින හෝ, විභාගයට පෙනී සිටීමෙන් පසු සුදුසුකම් නැත්තෙකු බවට දක්නට ලැබෙන හෝ යම් අපේක්ෂකයෙකුට විභාග ගාස්තුව මුළුමනින්ම හෝ ඉන් කොටසක් හෝ ආපසු ලබා ගැනීමට හිමිකමක් නැත.

11. *අයදුම්කරුගේ අනන්‍යතාව* :

අයදුම්කරු තමන් පෙනී සිටින එක් එක් විෂයයක් පාසා විභාග ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ඔහුගේ/ඇයගේ අනන්‍යතාව ඔප්පු කළ යුතුවේ. මේ සඳහා මතු සඳහන් ලියවිලි වලින් කවරක් හෝ පිළිගනු ලැබේ.

(i) පුද්ගලයින් ලියාපදංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත,

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

12. *සාවද්‍ය තොරතුරු සැපයීම* :

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තාවූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

13. පුරප්පාඩු පිරවීම හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

14. මෙම ගැසට් නිවේදනයේ සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් අවසාන තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි වන්නේය. එමෙන්ම පුරප්පාඩු පිරවීම හෝ නොපිරවීම හෝ පුරප්පාඩු වලින් කොටසක් පිරවීම පිළිබඳ අවසාන තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

15. මෙම ගැසට් නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් සිංහල භාෂා පාඨය බල පැවැත්වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ලේකම්,
කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය.

2015 ඔක්තෝබර් මස 08 වැනි දින,
05 වන මහල, සෙත්සිරිපාය දෙවන අදියර
බත්තරමුල්ල.

ඉල්ලුම් පත්‍රය
පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ
**සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුගත) තනතුර සඳහා බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය - 2015**
LIMITED COMPETITIVE EXAMINATION FOR RECRUITMENT TO ASSISTANT COMMISSIONER (DEPARTMENTAL) OF DEPARTMENT OF PROBATION AND CHILD CARE SERVICES - 2015

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4

(කාර්යාලීය ප්‍රයෝජනය පිණිසයි)

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

01. (i) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

(ii) අගට යෙදෙන නම මුලින්ද අනෙකුත් නම්වල මුලකුරු පසුවද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : GUNAWARDHANA, H. M. S. K.)

(iii) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

02. දැනට සිටින සේවා ස්ථානය සහ ලිපිනය : (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(ප්‍රවේශ පත්‍ර මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ.)

03. ස්ත්‍රී/පුරුෂ භාවය ☐ 0 - පුරුෂ 1 - ස්ත්‍රී (අදළ අංකය කොටුව තුළ ලියන්න)

04. ජාතික හැඳුනුම්පත් අංකය :

05. දුරකථන අංකය :

06. (i) ඔබ දැනට අයත් වන සේවය/ශ්‍රේණිය සහ ඊට ඇතුළත් වූ දිනය :————.

(ii) 1 වන ශ්‍රේණියේ සේවා කාලය :————.

07. 2015 අගෝස්තු මස 17 දිනට පූර්වාසන්න පස් අවුරුදු කාලය තුළ සියලුම වැටුප් වැඩිවීම් ඔබ උපයා ගෙන තිබේ ද? උපයා නොගත් වැටුප් වර්ධක වේ නම් එසේ වීමට හේතු දක්වන්න. :————.

08. ඉකුත් අවුරුදු 05 තුළ ඔබට විරුද්ධව විනයානුකූලව ක්‍රියා කරනු ලැබ ඇත් ද? එසේ නම් වරදේ සහ පනවන ලද දඬුවමේ ස්වභාවය සහ දඬුවම් කළ දිනය ආදියේ විස්තර දක්වන්න. :————.

09. විභාග ගාස්තු :
(i) ලදුපත් අංකය :————.
(ii) දිනය :————.
(iii) මුදල් ගෙවූ කාර්යාලය :————.
(iv) ගෙවන ලද මුදල :————.

| |
|---|
| මුදල් කුවිතාන්සිය නොගැලවෙන ලෙස එහි එක් දාරයකින් අයදුම්පතට අලවන්න (කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගන්න) |

10. *අයදුම්කරු ගේ සහතිකය :*

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීම හා විශ්වාසය පරිදි සත්‍ය බව ප්‍රකාශ කරමි. තව ද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති වලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි. විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාගය පිළිඳව පනවනු ලබන නීතිරීතිවලට එකඟව ක්‍රියා කිරීමටත් මෙම විභාගය පිළිබඳ ව්‍යවස්ථා අනුව මා නුසුදුස්සෙකු බව පෙනී ගියහොත් විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන් පසු හෝ මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීම ගැනත් මම එකඟ වෙමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

11. අධීක්ෂණ නිලධාරියාගේ සහතිකය :

මෙම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන ................. මයා/මිය/මෙනවිය, මා ඉදිරිපිටදී මෙම ඉල්ලුම් පත්‍රය අත්සන් කළ බවත් නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත් එම ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

————,
අධීක්ෂණ නිලධාරියාගේ අත්සන.

නම :————.
පදවිය :————.
ස්ථානය :————.
දිනය :————.

12. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :

මෙම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන .......................... මයා/මිය/මෙනවිය විසින් සඳහන් කර ඇති තොරතුරු මෙහි ඇති සේවා වාර්තා අනුව නිවැරදි බව ද, අදාළ ගැසට් නිවේදනයේ සඳහන් රෙගුලාසි ප්‍රකාර ඔහු/ඇය මෙම විභාගය සඳහා පෙනී සිටීමට යෝග්‍යතාව ලබා ඇති බවද, ඔහු/ඇය නියමිත විභාග ගාස්තු ගෙවා ඇති අතර, එම ලදුපත අලවා ඇති බව ද මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කිරීමට හැකි බව ද මෙයින් සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව තබන්න)

නම :————.
පදවිය :————.
ස්ථානය :————.
දිනය :————.

අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනයට පසුව විභාගයට පෙනී සිටීමට දක්වා ඇති භාෂා මාධ්‍යයේ වෙනසක් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

10 - 936

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.